පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය- තර්ක ශාස්ත්‍රය

සතිය- දෙසැ.- 1

ශ්‍රේණිය-13

සකස් කළේ - රත්නපුර කලාප අධ්‍යාපන කාර්යාලය

1. (අ) නිරීක්ෂණය හා සම්පරීක්ෂණය යන පද විද්‍යාවේ විධික්‍රමයේ යෙදෙන අන්දම පැහැදිලි කරන්න. (ඔබේ පිළිතුර කෙටි විය යුතුය. එහෙත් (i) අවශ්‍ය ලක්ෂණ සඳහන් කළ යුතුය. (ii) මේවාට උපකරණ භාවිතයේ අදාළත්වය සාකච්ඡා කළ යුතුය. (iii) එකිනෙකට උදාහරණයක් බැගින් දිය යුතුය.) (ලකුණු 06 යි)

(ආ) (i) පරමාදර්ශී සමීක්ෂණය

(ii) නිර්ණය පරීක්ෂණය

යන දෙක උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 04 යි)

2. පහත සඳහන් තර්ක වර්ග උපයෝගී කර ගනිමින් සංකේතයට නගා වෙන් රූප සටහන් මගින් ඒවායේ සප්‍රමාණතාව විමසන්න. යම් තර්කයක් නිෂ්ප්‍රමාණ වන්නේ නම් එය සංවාක්‍යමය තර්කයක් ලෙස ගෙන එහි සිදුව ඇති ආභාසය/ආභාස බිඳී ඇති රීතිය/රීති ද සඳහන් කරන්න.

(අ) මයිනා පක්ෂියෙකි.

සියලුම පක්ෂීන් ඉගිලේ.

එහෙයින් මයිනා ඉගිලේ.

(ආ) ඇරිස්ටෝටල් දර්ශනිකයෙකි.

ප්ලේටෝ දර්ශනිකයෙකි.

එහෙයින් දර්ශනිකයෝ සිටිති.

(ඉ) සමහර මිනිසුන් ඥානවන්ත ය.

කිසිම ඥානවන්තයෙක් මෝඩ වැඩ කරන්නේ නැත.

එහෙයින් මෝඩ වැඩ කරන සිකිවෙක් මිනිසෙක් නොවේ.